# දිවි නොතකා සිය සොයුරන් වෙනුවෙන් පෙරට ගිය කැනීෂියස්ගේ පරපුර

හලාවත සුදසුන ශාලාවේදී ධීවරයින්ගේ සමරු රැළිය පැවැත්වුණේ ධීවර විජේන්ද්‍ර සහෝදරයාගේ නායකත්වයෙන්. සමස්ථ ලංකා ධීවර ජනතා වෘත්තීය සංගමයේ ආරම්භය දැන් අවුරුදු ගණනකට ඉස්සර සිදු වුණත් මේ වගේ රට පුරා නියෝජිතයින් කැඳවලා මහා සම්මේලන රැළියක් පැවැත්වූයේ මුල්වරට, නොවැම්බර් 25 වැනිදා.

රට පුරා දස අතින් ගලා ආ ධීවර නියෝජිත පිරිස, එක්දහස් පන්සීයක් විතර ශාලාව අතුරු සිදුරු නැතිව පිරිල, එළියෙත් රැස් කකා හිටිය. මේ වගේ සිංහල, දෙමළ, මුස්ලිම් ආදී සෑම වර්ගයකම ධීවරයන්ගේ මහ රැළියක ප්‍රධාන කථිකයා වීම, අවුරුදු දහයෙදි විතර වැලලකරයට ආපු මටත් ලොකු ජයග්‍රහනයක්.

අනෙක් කථිකයෝ වුණේ රට පුරා පීඩිතයින්ගේ හඬ බවට පත්වෙමින් එන සාමූහිකයේ කැඳවුම්කරු සරත් ඉද්දමල්ගොඩ පියතුමාත්, අගෝස්තු 4 කම්කරු සන්ධානයේ නායක සමන් රත්නප්‍රිය සහෝදරයාත්. එදා බෝට්ටුව, ලෙල්ලම ගැන පමණක් කථා කරපු ධීවරයන් අද වෙනකොට ලෝක ධීවර ප්‍රජාවගේ සටන් ගැන කථා කරන තැනට පත්වෙලා සිටීමෙන් පෙනෙනවා දැන් ඒ ඇත්තෝ තමන්ගේ සමාජ ස්වභාවය ගැන අවදිවෙමින් සිටින බව.

## කැනීෂියස් යෝධයා

මේ රැළියේදී අරමුණ හැටියට තිබුණෙ, මැතදී ඉංදියානු සිරකඳවුරක් ඉදිරිපිට වෙඩි තබා මරා දමූ මහා ධීවර කැනීෂියස් ගේ මරණ දිනය ජාතික වීර දිනයක් ලෙසට නම් කිරීමයි. කැනීෂියස් තමන්ගේ ජීවිතය නොතකා තම වෘත්තීය වර්ගය වෙනුවෙන් ඉදිරියට ගිය සද්ධන්ත යෝධයෙක්. මහ සයුර තලා එගොඩ වූ නීල මහා යෝධයා වගේ කැනීෂියස් මුහුදෙන් එතෙර වී ඉංදීය මර්ධකයන් සමඟ තම සොයුරන් නිදහස් කරුනීමට පොර බැදුවා.

කටින්, අතින් පයින් යට කරගත නොහැකි මේ නූතන නීල යෝධයා ධීවර කැනීෂියස්ට මර්ධකයින් මුහුණ දුන්නේ තුවක්කුවේ පිහිටෙන්. එයින් කැනීෂියස් නිතර දිවි පුදන ධීවරයින්ගේ ඓතිහාසික මහා වීරයෙක් වුණා. ඒකයි ඔක්තෝබර් 5 විරු දිනය ලෙසට ඔවුන් යොදා ගත්තේ.

## ධීවරයා

ධීවරයින්ගේ දුක්මුසු කථාවත් පැරණි සමාජය තුළින්ම ගලාගෙන එන දෙයක්. එදා ගොවියා, ගොපල්ලා, එඬේරා ආදී කෘෂි සමාජයේ වරිග අතරත් ධීවරයාට හිමි වුනේ අඩු තැනක්. මඩ සෝදාගත් ගොවියා රජකමට සුදුසු බව කියවුණත් කරදිය සෝදාගත් ධීවරයාට එවැනි ඇගයීමක් තිබුණේ නෑ.

බොහෝ වේලාවට විප්ලවවාදී සාහිත්‍ය තුළත් ගොවියා යන්නටම ධීවරයා ඇතුල් කරලයි සමාජ විමසුම් කරන්නේ. ඒත් එදා වුණත්, අද වුණත් ගොවියගේ ජීවිතයට වඩා වෙනස් දෛනික පැවැත්මක් තුළයි ධීවරයා සිටින්නේ.

ධීවර රස්සාව අදත් අනතුරුදායක එකක්. වත්මන් රජයේ ප්‍රතිපත්තිවලින් ඇති වෙලා තිබෙන අළුත් අභියෝග නැති වුණත් ස්වභාවිකවම ධීවරයා මරුවා සමඟ වාසය කළ යුතුයි. කුණාටුවක්, චණ්ඩ මාරුතයක්, හෙණ ගෙඩියක් කොයි වේලේ එයිද කියලා කියන්න බෑ. මෝරෙක් නැත්නම් වෙන සතෙක් කොයි වෙල් පහර දෙයිද කියන්න බෑ. මහ මුද තුළදී අමාරු ලෙඩක් වැළඳුනොත් පිහිටක් ගන්න පිළිවෙලක් නෑ.

ඒ විතරක් නෙවෙයි, ඉදහිට එන සුනාමියෙත් ප්‍රධාන ගොදුර ධීවරයායි. පසුගිය සුනාමියෙන් වූ විනාශයෙන් 60% කටත් වඩා දරන්න වුණේ ධීවර පවුල්වලටයි. මේ වගේ ඉතාම භාරධූර ජීවිත පරදුවට තබා කරන රස්සාවක් තමා මූදු රස්සාව.

ඒ මගින් ධීවරයා සමාජයට ගෙන එන්නේ මහඟු සම්පතක්. දැන් විදුධරයෝ හුඟ දෙනෙක් කියන්නේ මාළුවල විශේෂ වටින ආහාර පදාර්ථයන් තිබෙන බවයි. එයින් විශේෂයෙන්ම මොළය වැඩෙන බවයි. මේ වගේ මිල කළ නොහැකි සේවයක් ජීවිතය පරදුවට තබා කරන ධීවරයා ගැන පැරණි සමාජයේ නිසි ඇගයුමක් නැති වුණත් අද ධනපති සමාජය තුළ හෝ ඇති වෙලා තිබෙනවද?

## අපේ රටේ ධීවරයා

ලංකාව තුළ ධීවරයාට මෙයට අමතරව පවතින ආර්ථික සමාජ ගමන නිසා ඇති වන තර්ජන මීට වඩා විශාලයි. දැනට ගෙන යන විවෘත ආර්ථිකය තුළ සම්ප්‍රදායික ගොවියා මෙන්ම ධීවරයා විනාශයට මුහුණ දෙන අය බවට පත්වෙලා.

බහුජාතික තන්ත්‍රය කරන්නේ මේ වගේ නිෂ්පාදකයින් විනාශ කරලා ඔවුන්ගේ ආම්පන්න මකා දමල මහාපරිමාණ ක්‍රියාමාර්ගයක ඔවුන්ගේ සමහරුන් ගොනු කරගැනීමයි. වැඩි දෙනෙක් මිනිස් දූවිලි ලෙස සමාජයේ අද්දරට විසි කර දැමීමයි.

බහුජාතික බූවල්ලන් සමඟ සටනේදී "වගා කරන්නාට ඉඩම් දියව්" කියන සටන්පාඨය ගොවියාට දමා ගන්න පුළුවන්. ඉඩම අල්ලා ගැනීමට සටන් කරන්නට පුළුවන්. අඩුතරමේ ධීවරයාට මහ මුහුදේවත්, වෙරළේවත් අයිතිය ගැන කියන්න විදියක් නෑ.

මහ නැව් රජයේ අවසරයෙන් මුහුදට එනව නම් බෝට්ටුකාරයින් නිකම්ම පැත්තකට විසි වන එක නවත්වන්න නම් ඔවුන්ට සටන් කරන්න වෙන්නේ මහ පාර, මහ නගර තුළ මිස මුහුදෙ නෙවෙයි. ඒ සඳහා ධීවරයාට වෙනම සංවිධාන සැලැස්මක් අවශ්‍ය වෙනව. විශේෂයෙන් නගරේ, පාරේ නිර්ධනයින්ගේ උදව් නැතිව ධීවර සටන උස්සන්න අමාරුයි.

## ධීවරයා සුන් කරන යුද්ධය

ආණ්ඩුවේ යුධ ප්‍රතිපත්තිය නිසා ඇත්තටම සාගරය අඳුරෙන් වැහිලා වගේ. මහ නැව් මදිවට යුධ නැව් වේගයෙන් එහා මෙයා යන කොට බෝට්ටුකාරයෝ මොනවා කරන්නද? ඊළඟට යුද්ධයේ උවමනාව උඩ මුහුද අධිආරක්ෂක කලාප ලෙස තහනම් කරනවා.

මාළු ඊන්නම තැන් ධීවරයාට තහනම් කළාම කොහොමද රස්සාව කරන්නේ. මාළු ඉන්න වෙලාවේ අල්ලන්නේ නැතිව වෙන වෙලාවක මාළු කොහොම අල්ලන්නද?

අනෙක් අතට අධිවේගී අධිබලැති බෝට්ටු නැතිව රළ මැඩගෙන ඈතට යන්නත් බෑ. ඉක්මණට එන්නත් බෑ. අශ්වබල 30 ට වැඩි බෝට්ටු තහනම් කරලා. නාවික හමුදාවේ මහත්තුරු කියන්නේ වේගයෙන් යන බෝට්ටුවල ඉන්නේ කොටිද නැද්ද කියලා හොයාගන්න අමාරුයි කියලයි. ඒත් ආණ්ඩුව කියන්නේ උඩ ඉඳන් බැළුවත් කොටින්ගේ යාත්‍රා හඳුනාගන්න පුළුවන් කියලයි.

කොටියා ධීවරයා වෙන් කරන්න බැරි නම් කොටියා ගොවියගෙන්, කම්කරුවගෙන් බේරලා වෙන් කරන්නේ කොහොමද?

යුද්ධය විශාල වශයෙන් ධීවරයා සුන් කරන යුද්ධයක් වෙලා. මේ යුද්ධය වහා නවත්වලා ජාතික ප්‍රශ්නය සාකච්ඡාවෙන් විසඳාගන්න කියල ධීවර ජනතාව විශේෂයෙන් හඬ නගන්නේ ඒ නිසයි.